
# සූර්ය දර්ශකය:

## භාවිතය සඳහා උපදෙස්




පූර්ණ සූර්යග්‍රහණය

2024 අප්‍රේල් මස 08 වැනි සඳුදා

© 2017-2024
Eclipse2024.org

# TERMS AND CONDITIONS FOR USE OF ECLIPSE GLASSES

**Please read these Instructions for Use carefully before using the Eclipse Glasses. Your purchase and use of the Eclipse Glasses constitutes your agreement to these Terms and Conditions. Failure to follow these Instructions for Use may result in serious personal injury, including permanent eye damage. If you do not understand these Instructions or cannot follow them diligently and completely, then you should not look at the Sun at any time, with or without the Eclipse Glasses.**

The term "Eclipse Glasses" refers to the special cardboard-and-polymer optical products, marked "ISO 12312-2" and "SAFE FOR DIRECT SOLAR VIEWING", manufactured by Rainbow Symphony of Reseda CA or American Paper Optics of Bartlett TN, and sold by Eclipse2024.org for the purpose of viewing the Sun during the solar eclipse of April 8, 2024, by or under the direct supervision of a person 18 years of age or above and in accordance with these Instructions for Use.

Observing the Sun directly, without the benefit of eye protection provided by the Eclipse Glasses, will likely result in serious personal injury, up to and including permanent eye damage and blindness. When these Instructions for Use are followed completely and precisely, the undamaged and unmodified Eclipse Glasses have been proven to be safe and effective in allowing direct, short-term viewing of the Sun. If these Instructions for Use are not followed, or if damaged or modified Eclipse Glasses are used, permanent eye injury could result.

You should never look directly at the Sun, with or without the aid of the Eclipse Glasses, if you have any temporary or permanent medical or other condition which either (1) prevents your use of the Eclipse Glasses according to these Instructions for Use, or (2) which predisposes you to an increased or special risk of incurring, worsening, or contributing to the effects of any optical condition, or other medical, health, or other condition, by looking or attempting to look at the Sun.

You should never attempt to perform any other activity (such as driving or walking) while using the Eclipse Glasses.

You agree that if you allow others to use the Eclipse Glasses, you will provide each such user with a copy of these Instructions for Use and will make sure such user reads and understands the Instructions for Use before using the Eclipse Glasses.

By using the Eclipse Glasses to view the Sun, you agree with the following:

(a) you understand these Instructions for Use completely;
(b) you understand and accept the risks associated with improper use of the Eclipse Glasses;
(c) you accept full responsibility for, and assume all risks associated with, the act of viewing the Sun, with or without the use of the Eclipse Glasses; and
(d) the Eclipse Glasses are fragile, and any damage or modification will render them immediately and permanently unusable for their intended purpose.

Release and Limitation of Liability

By way of purchasing and using the Eclipse Glasses, you are irrevocably releasing, indemnifying, and holding harmless the manufacturer and seller from any liability, loss, claim and expense (including attorney's fees), including but not limited to bodily injury or other personal harm, which may result from using the Eclipse Glasses under any circumstances or conditions and irrespective of jurisdiction. Neither the manufacturer nor the seller will be responsible for any damages of any kind, irrespective of reasons, conditions or circumstances, including malfunctioning of the Eclipse Glasses. All risks associated with using the Eclipse Glasses rest solely and entirely with the user, irrespective of whether the Eclipse Glasses are used by the original purchaser or any third party. You fully understand and assume the risks in using the Eclipse Glasses. You confirm that you have read this release of liability and fully understand its terms and that you have given up substantial rights by purchasing and using the Eclipse Glasses.

THE MANUFACTURER AND SELLER OF THE ECLIPSE GLASSES MAKE NO WARRANTY OF ANY KIND, EXPRESSED OR IMPLIED, WITH RESPECT TO THE ECLIPSE GLASSES, INCLUDING BUT NOT LIMITED TO THE IMPLIED WARRANTIES OF MERCHANTABILITY, FITNESS FOR A PARTICULAR PURPOSE, AND NON-INFRINGMENT. NEITHER THE MANUFACTURER NOR THE SELLER SHALL BE LIABLE FOR ANY OTHER DAMAGES, INCLUDING BUT NOT LIMITED TO DIRECT, INDIRECT, INCIDENTAL, SPECIAL, CONSEQUENTIAL, OR EXEMPLARY DAMAGES, WHETHER IN AN ACTION IN CONTRACT OR TORT (INCLUDING NEGLIGENCE AND STRICT LIABILITY), SUCH AS, BUT NOT LIMITED TO, LOSS OF ANTICIPATED PROFITS OR BENEFITS RESULTING FROM, OR ARISING OUT OF, OR IN CONNECTION WITH THE USE OR FURNISHING OF THE ECLIPSE GLASSES OR THE PERFORMANCE, USE OR INABILITY TO USE THE SAME, EVEN IF THE MANUFACTURER OR SELLER HAS BEEN ADVISED OF THE POSSIBILITY OF SUCH DAMAGES. IN NO EVENT WILL THE MANUFACTURER'S OR SELLER'S TOTAL LIABILITY EXCEED THE PRICE PAID FOR THE PRODUCT.

Note Regarding Translations

Translations of these Instructions for Use into various languages are provided "AS-IS" and solely for the convenience of the reader. Eclipse2024.org has made reasonable efforts to ensure the accuracy of the Translations; however, in the event of any perceived discrepancy in meaning or interpretation between the English version and any Translation, the English version will prevail. You should not act in reliance on anything contained in any Translation of these Instructions for Use, but should refer to the official English version.


© 2014-2024
Eclipse2024.org


# පූර්ණ සූර්යග්‍රහණය – 2024 අප්‍රේල් 08

**උතුරු ඇමරිකාව වෙත ඔබව සාදරයෙන් පිළිගනිමු!**

සූර්යයාගේ පූර්ණ ග්‍රහණයක් අත්දැකීම සඳහා අප රටේ සංචාරය කිරීමට ඔබව තෝරාගෙන ඇති අතර, සියලු දෙනාට ආරක්ෂිතව මෙම විශිෂ්ට අවස්ථාව නැරඹීම සඳහා ඉඩ ප්‍රස්තාව සැලසීමට ලැබීම අපට ඉමහත් ගෞරවයක්!

අපි ඔබගේ පහසුව තකා මේ උපදෙස් සිංහලෙන් ලබා දී ඇත.මෙම උපදේශයන්, නිර්දේශයන් සහ වියාචනයන් (“උපදෙස් මාලාව”) වල ඉංග්‍රීසි පිටපත, සූර්යයා සෘජු ව නැරඹීම සඳහා සූර්ය දර්ශකය නිසි හා නිවැරදි ව භාවිතා කිරීමේ දී වැදගත් වන තොරතුරු හා උපදෙස් ඇතුළත් අංග සම්පූර්ණමූලාශ්‍රයකි.මෙම උපදෙස්https://tinyurl.com/2024Instructionsදී ලබා ගත හැකි වන අතර, සූර්ය දර්ශකය භාවිත කිරීමට නම් ඔබ ඒවා කියවා, තේරුම් ගෙන අනුගමනය කළ යුතු වේ. **එහි සඳහන් උපදෙස් අනුගමනය කිරීමට අසමත් වීමෙන් බරපතල පුද්ගලික තුවාල ඇති විය හැක.**

2024 අප්‍රේල් මස 08 වැනි දින ඇතිවන ග්‍රහණය, නක්ෂත්‍ර විද්‍යාඥයින් විසින් “පූර්ණ සූර්යග්‍රහණය” ක් ලෙස ප්‍රකාශ කලත්,ඔබට පූර්ණ ග්‍රහණය දැකගැනීමට නම් උතුරු ඇමරිකාව හරහා යන පථයක (“පූර්ණ ග්‍රහණයේ ගමන්මග” ලෙස හැඳින්වේ) ස්ථානගත විය යුතුය. ඔබ මෙම ගමන්මාර්ගය තුළ නොසිටින්නේ නම්, ඔබට අර්ධ ග්‍රහණයක් පමණක් දැකගත හැකිවනු ඇත! එම නිසා, ඔබ පූර්ණ ග්‍රහණයේ ගමන්මගෙහි සිටින්නේ දැයි දැන ගැනීම ඉතා වැදගත් වන අතර, ඔබ විසින් භාවිත කළ යුතු ආකාරය ඉදිරියේදී පැහැදිලි කෙරේ.



පූර්ණ ග්‍රහණයේ ගමන්මග

## ඇරඹුම්උපදේශකය                සවිස්තරාත්මක උපදෙස්

මෙම ලිපිය තුළ දී’ භාවිත වන “සූර්ය දර්ශකය” නමැති වචනයෙන්, පළමු පිටුවෙහි ඇතුලත් වියාචනයේ හා ලිපියේ අනෙකුත් තැන්වල සඳහන් “Eclipse Glasses” නියෝජනය කරයි.

සූර්යයා නැරඹීම සඳහා ඔබේ සූර්ය දර්ශකය භාවිතය  නීතිමය ගිවිසුමකට යටත් වේ. ඕනෑම අවස්ථාවකදී සූර්යයා නිරීක්ෂණය කිරීම සඳහා සූර්ය දර්ශකය භාවිතා කිරීමට නම්, උපදෙස් මාලාව තුළ අඩංගු සියලුම උපදෙස් හා මඟ පෙන්වීම්, ඔබ නිවැරදිව හා සම්පූර්ණයෙන්ම අනුගමනය කළ යුතුයි. ඔබට උපදෙස් තේරුම්ගත නොහැකි නම්, හෝ ඔබට ඒවා සම්පූර්ණයෙන්ම හා නිවැරදිවඅනුගමනය කිරීමට නොහැකි නම්, හෝ ඔබ ඔවුන්ගේ කොන්දේසිවලට එකඟ නොවන්නේ නම්, ඔබ විසින් කුමන අවස්ථාවක හෝ කිසියම් ක්‍රමයක් භාවිතකොට සූර්යයා බැලීමට තැත් නොකරන ලෙසට උපදෙස් හා අවවාද  දෙමු.

*© 2014-2024*
*Eclipse2024.org*

# සූර්ය දර්ශකයේ ඇරඹුම් උපදේශකය

මෙම උපදේශකය, [සිංහල බසින් රචිත සවිස්තරාත්මක උපදෙස් මාලාව](#) කින් සංක්ෂිප්ත කරගත්තක් වන අතර, සූර්යග්‍රහණය නැරඹීම සඳහා සූර්ය දර්ශකය භාවිතා කිරීමට නම්, ඔබ එය කියවා තේරුම්ගෙන ඒ සියල්ලටම අනුකූල විය යුතු වේ.

1) **ඔබේ ස්ථානයට සූර්ය ග්‍රහණය පූර්ණ ලෙස දිස්වන්නේ දැයි දැනගැනීමට මෙන්ම, එම ස්ථානයට අර්ධ හා (අදාළ නම්) පූර්ණ අදියර දිස්වන දළ වේලාවන් දැනගැනීමට [eclipse2024.org/find-times](#) වෙත පිවිසෙන්න.**

2) **පූර්ණ සූර්යග්‍රහණයක් යනු නිසැකවම චමත්කාරජනක අවස්ථාවක්. නමුත් ඔබට පූර්ණ ග්‍රහණයේ අත්දැකීම විඳ ගැනීමට හැකි වනුයේ, කිලෝමීටර් දෙසියයක් පමණ පුළුල් – "පූර්ණ ග්‍රහණයේ පථය" තුළ ස්ථානගත වී ඇත්නම් පමණි. පූර්ණ ග්‍රහණය, ඔබ සැලසුම් කරගත් ස්ථානයේ සිට දර්ශනය නොවේ නම්,ග්‍රහණයේ ගමන්මග තුළ ඇති පිහිටුමක නැවත ස්ථානගත වන මෙන් අපි තදින් උපදෙස් දෙන්නෙමු!**

3) **සූර්ය දර්ශකය භාවිතයේ දී, ඔබේ දෑස් ඍජුවම සූර්යයා නිරීක්සීමෙන් ආරක්ෂා කිරීම සඳහා, සූර්ය දර්ශකයේ කාච උපකරණය ඔබේ ඇස් කෙළින්ම රඳවා තබාගන්න.**

4) **සූර්යයා දෙස බැලීමට සූර්ය දර්ශකය යොදාගත යුතු අවස්ථා:**
   - **a. සූර්ය ග්‍රහණය ඔබේ පිහිටීමේ දී පූර්ණ නොවන්නේ නම්, සෑම විටම සූර්ය දර්ශකය හරහා එය නිරීක්ෂණය කරන්න. ඔබ නිසි දෑස් ආවරණයක් නොමැතිව හිරු දෙස බැලුවහොත්, ඔබ ඔබේ දෑස් ස්ථිර හානි අවදානමකට ලක් කරයි!**
   - **b. සූර්ය ග්‍රහණය ඔබේ පිහිටීමේ දී පූර්ණ වන්නේ නම්, සූර්යයාගේ තැටියේදීප්තිමත්ප්‍රදේශයේ යම් කොටසක් - ඉතා කුඩා කොටසක් පවා දර්ශනය වුවත්, ඒ අවස්ථාවේ දී සූර්ය දර්ශකය තුලින් නිරීක්ෂණය කරන්න. ඔබ මෙමඋපදෙස් අනුගමනයකිරීමට අසමත් වුවහොත්, ඔබ ඔබේ දෑස් ස්ථිර හානි අවදානමකට ලක් කරයි!**
     - **i. කෙසේ වෙතත්, සූර්යයාගේ තැටියේ කිසිදු දීප්තිමත්කොටසක්දැක ගත නොහැකි විට, පූර්ණ ග්‍රහණයේ කෙටි විරාමය තුළ දී පමණක් සූර්ය දර්ශකය භාවිත නොකොට ග්‍රහණය දෙස කෙලින්ම බැලිය යුතුයි.**
     - **ii. ඇත්ත වශයෙන් ම කියතොත්, ඔබ පූර්ණ ග්‍රහණය අතරවාරයේ දී සූර්යයානැරඹීම සඳහා සූර්ය දර්ශකය භාවිත කිරීමට උත්සහ කළහොත්, ඔබ නිසැකයෙන්ම කිසිවක් නොදකිනු ඇත!**
     - **iii. පූර්ණ ග්‍රහණය නිමා වී නැවත සූර්යයාගේ තැටියේ දීප්තිමත් කොටස දිස්වන විගසම, ආපසු සූර්ය දර්ශකය භාවිතා කළ යුතුයි.**

5) **වෙනත් වචනවලින් කියනවා නම්,**

**හිරුගේ දීප්තිමත් තැටියේ යම් කොටසක් දිස්වන විට දී, හිරු දෙස බැලීමට නම් ඔබ විසින් සූර්ය දර්ශකය යොදා ගත යුතු වේ!**

*© 2014-2024*
*Eclipse2024.org*

# සූර්ය දර්ශකය භාවිතය සඳහා සවිස්තරාත්මක උපදෙස්

පළමුව, ඔබ තේරුම් ගත යුතු ඇතැම් පාරිභාෂික වචන කිහිපයක් තිබෙනවා!

එක් එක් ග්‍රහණයන් සඳහා, සහ පොළොව මත ඇති එක් එක් පිහිටුම් සඳහා, යම් යම් වැදගත් සිද්ධිඅවස්ථාවන්ට ලබා දී ඇති නාමයන් තිබෙනවා. මේවා හඳුන්වනු ලබන්නේ:

| සිද්ධියේ නම | සිද්ධිය පිළිබඳ විස්තරය | පෙනෙන අයුරු (පූර්ණ ග්‍රහණයකදී) | පෙනෙන අයුරු (අර්ධ ග්‍රහණයකදී) |
|---|---|---|---|
| C1 | අර්ධ ග්‍රහණයේ පටන්ගැන්ම |  |  |
| C2 | පූර්ණ ග්‍රහණයේ පටන්ගැන්ම |  | ** සිදු නොවේ! ** |
| මධ්‍ය-ග්‍රහණය | සූර්ය ග්‍රහණයේ මධ්‍ය-ලක්ෂ්‍යය |  |  |
| C3 | පූර්ණ ග්‍රහණයේ නිමාව |  | ** සිදු නොවේ! ** |
| C4 | අර්ධ ග්‍රහණයේ නිමාව |  |  |

© 2014-2024
Eclipse2024.org

## 1) සූර්ය දර්ශකය භාවිතය සඳහා පොදු උපදෙස්



1) සූර්ය දර්ශකය ප්‍රවේසමෙන් ගලවන්න[අදාළ නම්].
2) භාවිත නොකරන විට සූර්ය දර්ශකය ආරක්ෂිතව තබන්න.
3) භාවිතයට පෙර සූර්ය දර්ශකය පරීක්ෂා කර බලන්න; කාච පටල යම් ආකාරයකින් පළුදු වී හෝ සීරී ඇත්නම්, එම සූර්ය දර්ශකය කපා විනාශ කර, එය වෙනුවට හොඳ තත්ත්වයේ පවතින ආදේශකයක් ලබාගන්න.
4) කාච පටල යම් ආකාරයකින් පළුදු වී ඇත්නම්, කිසිම අවස්ථාවක දී හිරු දෙස බැලීමට එම සූර්ය දර්ශකය යොදා නොගන්න.
5) සූර්ය දර්ශකයෙන් කාච පටල උපකරණය ඉවත් නොකරන්න. එමෙන්ම කිසිදු ආකාරයකින් සූර්යයා නැරඹීම සඳහා කාච පටල ඉවත්කළ උපකරණයක් භාවිත නොකරන්න.
6) සූර්ය දර්ශකය තුළ ඇති නිවැරදිව සවි කළ, පළුදු වී නොමැති කාච මගින් දෘෂ්‍ය ආලෝකයේ අනතුරුදායක තලාවන් මෙන්ම හානිකර වූ පාරජම්බුලහාඅනෙකුත්සූර්යකිරණඅවහිරකරනුලැබේ.එම නිසාවෙන්, ඕනෑමඅවස්ථාවකදී සූර්යයාදෙස බැලීමසඳහා, මෙම උපදෙස් මාලාවේ අඩංගු නිර්දේශනයන් අනුව සූර්ය දර්ශකය භාවිතය බෙහෙවින් ආරක්ෂාකාරී වේ. සූර්ය ග්‍රහණ කාලය තුලදී සූර්යයා දෙස බැලීම අහිතකර කරන්නා වූ විශේෂ "ග්‍රහණ කිරණ"නොමැත.
7) **සූර්යයාගේ දීප්තිමත් තැටියේ යම් කොටසක් දෘශ්‍යමාන වන අවස්ථාවන්හිදී , ආරක්ෂාකාරීව සූර්යයා දෙස බැලීමට නම්, මෙහිවිස්තරකරඇතිආකාරයට සූර්ය දර්ශකය භාවිත කළ යුතුවේ. ඔබ කිසියම් මූලාශ්‍රයකින් සටහන් කරගෙන ඇති සියලුම සූර්ය ග්‍රහණ වේලාවන් (එනම්, ඉහතවිස්තරකරඇතිආකාරයට "C2" හා "C3") සඳහා මෙය සත්‍ය වේ.**
8) මෙම සූර්ය දර්ශකය, ආලෝකය සම්ප්‍රේෂණය හෝ පරාවර්තනය කරන දුරේක්ෂය, දෙනෙතිය, කැමරා, කාච, දර්පණ, හෝ වෙනත් ඕනෑම ප්‍රකාශ උපකරණයක්, උපාංගයක් හෝ වස්තුවක් ("දෘෂ්‍ය උපාංග") සමඟ සංයෝජනයෙන් භාවිත නොකරන්න.
9) කිසිම විටෙකදී,එවැනි දෘෂ්‍ය උපාංගයක් සූර්යයා දෙසට හෝ ඒ වෙත එල්ල කිරීමෙන් වලකින්න. එමෙන්ම සූර්යයා දෙසට එල්ල කර ඇති හෝ සූර්යයාගේ ආලෝකය රැස් කරන, නාභිගත කරන, හෝ පරාවර්තනය කරන කිසියම් ම දෘෂ්ටි උපකරණයකින් සූර්යයාගේ ප්‍රතිබිම්බයදෙස බැලීමෙන් වලකින්න.
10) කිසිම විටෙකදී, සතුන්ට හෝ තාවකාලිකව ආබාධිත, කියවීමට, තේරුම් ගැනීමට හා සූර්ය දර්ශකය ප්‍රවේසමෙන් හැසිරවීමට වුවමනා අවශ්‍යතා වලට අනුකූල වීමට, හෝ ඔවුනොවුන්ගේ ක්‍රියාවන්හි ප්‍රතිවිපාක කෙරෙහි නීතිමය වශයෙන් වගකීම් භාරගැනීමට නොහැකිඕනෑම අයෙකුටසූර්ය දර්ශකය භාවිත කිරීමට ඉඩ නොදෙන්න.



11) සූර්ය දර්ශකය භාවිතය සඳහා:

    සූර්ය දර්ශකයේ කාච උපකරණය නිරන්තරයෙන් මුළුමනින්ම ඔබගේ දෑස් හා සූර්යයාඅතර පිහිටුවා ගෙන, සූර්ය දර්ශකයේ පළුදු නොවූ එම කාච උපකරණය හරහා සූර්යයා දෙස බලන්න. කාඩ්බෝඩ්ඇස්කණ්ණාඩිලෙසහැඩගැසුනු සූර්ය දර්ශක භාවිත කරන්නේ නම්, සම්මත ඇස් කණ්නාඩි ආකාරයෙන් ඔබ එම කාඩ්බෝඩ් එක නවා හැඩගස්වා ගතයුතු වේ. සූර්යයා එහි පූර්ණ ග්‍රහණයේ සිටින විටදී (එනම්, පහත වගුවේසඳහන්වන C2 හා C3 අතර කාලයේදී - එම කාලයන් ඔබගේ පිහිටුම් ස්ථානයට අදාළ නම් පමණි), ඔබ විසින් සූර්ය දර්ශකයේ පළුදු නොවූ එම කාච උපකරණය තුළින් බලනවා හැර කිසිම විටකදී කෙලින් ඒ දෙස නොබලන්න.
12) සූර්යයා නිරීක්ෂණය කිරීමට උත්සහ කිරීමේදී, සූර්ය දර්ශකය මුලින් නිෂ්පාදනය කර තිබු සැටියෙන් එහි රැඳවුම් අතර සවිකර ඇති කාචහැර,වෙනත් ද්‍රව්‍යයක් හෝ වස්තුවක් ඇස් ආවරණය ලෙස භාවිත නොකරන්න.
13) ඔබට මෙම උපදෙස් සම්බන්ධයෙන් කිසියම් ගැටලුවක් තිබේ නම්, කරුණාකර https://tinyurl.com/glasses-questions ඔස්සේ Eclipse2024.orgඅප අමතන්න.

© 2014-2024
Eclipse2024.org

## 2) ඔබගේපිහිටීම සඳහාසූර්යග්‍රහණය දිස්වන නිශ්චිත වේලාවන් දැනගන්න

ඔබගේ පිහිටීම සඳහා eclipse2024.org/find-timesවිසින් සපයා ඇති තොරතුරු අනුව, පහත දැක්වෙන ප්‍රකාශය සම්පූර්ණ කරන්න:

**මගේ පිහිටීම සඳහා, සූර්ය ග්‍රහණය:**

| | |
|---|---|
| **පූර්ණ වේ** | **පූර්ණ නොවේ** |

(එකක් රවුම් කරන්න)

| | |
|---|---|
| **ඔබේ පිහිටීමේ දී ග්‍රහණය පූර්ණ වේ නම්, පහත දැක්වෙන**<br><br>**"මගේ පිහිටීමේදී ග්‍රහණය පූර්ණ වේ"**<br><br>**යන කොටස තුළ අඩංගු උපදෙස් අනුගමනය කරන්න:** | **ඔබේ පිහිටීමේ දී ග්‍රහණය පූර්ණ නොවේනම්, පහත දැක්වෙන**<br><br>**"මගේ පිහිටීමේදී ග්‍රහණය පූර්ණ නොවේ"**<br><br>**යන කොටස තුළ අඩංගු උපදෙස් අනුගමනය කරන්න:** |

*© 2014-2024*
*Eclipse2024.org*

## ** මගේ පිහිටීමේදී ග්‍රහණය පූර්ණ වේ **

ඔබ පූර්ණ ග්‍රහණයේ ගමන්මගෙහි සිටිනා අතර, දුර්ලභහා ආශ්චර්යජනක සිදුවීමක් අත්දකිනු ඇත! සූර්ය ග්‍රහණය ඔබේ පිහිටීමේදී පූර්ණ ව දිස්වන වේලාව නිශ්චය කර ගැනීම ඔබ විසින් කලයුතු ඉතා වැදගත් කාර්යයක්. මෙයඔබටපහත සඳහන් කරගන්නා ලද වේලාවන් පිළිබඳව අවධානයෙන් සිටීමෙන්මෙන්ම, පූර්ණ ග්‍රහණ කාලය තුලදී සූර්යයාගේ තැටියේ කිසිදු දීප්තිමත් කොටසක් දිස් නොවන නිසාවෙන් ද දැනගත හැකි වේ.

1) ඔබගේ නිශ්චිත පිහිටීම සඳහා eclipse2024.org/find-times විසින් සපයා ඇති තොරතුරු මත පදනම් ව, පහත ලැයිස්තු ගත කර ඇති එක් එක් ග්‍රහණ සිද්ධීන් වලට අදාළ දළ වේලාවන්සටහන් කර තබාගන්න (ඔබගේ වේලා කලාපය අනුව වේලාව වෙනස් කරගැනීමට ද වග බලාගන්න!):

| | | | | | |
|---|---|---|---|---|---|
| **C1 ට පෙර** | * කිසිදු ග්‍රහණයක් නොමැත * | |  |  | ඔබ සූර්ය දර්ශකය භාවිත කළ **යුතුයි** |
| **C1** | **අර්ධ ග්‍රහණය ඇරඹෙන්නේ:** | |  |  | ඔබ සූර්ය දර්ශකය භාවිත කළ **යුතුයි** |
| **C2** | **පූර්ණ ග්‍රහණය ඇරඹෙන්නේ:** | |  |  | **C2 වලින් පසුව**, ඔබට පියවි ඇසින් නිරීක්ෂණය කළ හැකියි |
| **මධ්‍ය-ග්‍රහණය** | **සිදුවන්නේ:** | |  |  | **ඔබට පියවි ඇසින් නිරීක්ෂණය කළ හැකියි!** |
| **C3** | **පූර්ණ ග්‍රහණය නිමා වන්නේ:** | |  |  | ඔබ නැවත වරක් සූර්ය දර්ශකය භාවිත කළ **යුතුයි** |
| **C4** | **අර්ධ ග්‍රහණය නිමා වන්නේ:** | |  |  | ඔබ සූර්ය දර්ශකය භාවිත කළ **යුතුයි** |
| **C4 ට පසු** | * කිසිදු ග්‍රහණයක් නොමැත * | |  |  | ඔබ සූර්ය දර්ශකය භාවිත කළ **යුතුයි** |

2) ඔබ පූර්ණ ග්‍රහණයේ ගමන්මගෙහි ස්ථානගත වී ඇතිමුත්, සූර්යයා නැරඹීමට නම්, ග්‍රහණය පූර්ණ නොවන කාලයේ දී එනම්C2 ට පෙර හෝ C3 ට පසුව ඇති සියලු වේලාවන්හිදී ද සූර්ය දර්ශකය භාවිත කළ යුතුයි.

© 2014-2024
Eclipse2024.org

3) ඔබට පියවි ඇසින් (සූර්ය දර්ශකය භාවිත නොකර) සූර්යයා ව කෙලින්ම නිරීක්ෂණය කළ හැකි වන්නේ:
   a. ග්‍රහණය ඔබේ පිහිටීමේ දී පූර්ණ වේ නම් (ඔබ "ගමන්මග තුළ" සිටින විට), සහ
   b. පූර්ණ ග්‍රහණ වේලාවන් තුළදී (ආසන්න වශයෙන්, ඔබ ඉහත සටහන් කරගත් පරිද්දෙන් ඔබගේ පිහිටීම සඳහා වන C2 හා C3 අතර කාලය තුළ),
   c. **සූර්යයාගේ දීප්තිමත් තැටිය මුළුමනින්ම චන්ද්‍රයාගෙන් වැසී යන විටදී.**

ඔබගේ නිශ්චිත පිහිටීම අනුව, පූර්ණ ග්‍රහණයේ සැබෑවේලාවන් බොහෝ සෙයින් ම වෙනස් විය හැකි අතර, ඒ නිසාවෙන් ඔබ විසින් කලියෙන්ම එම දළ වේලාවන් දැනගෙන එය සටහන් කර තබාගත යුතුය. ඔබ ඉහත සටහන් කරගන්නා වේලාවන් දළ අගයන් වේ!

4) නැවත වරක් මතක් කලොත්, ඉහත ලැයිස්තුවේ සටහන් කරගෙන ඇති, හෝ කිසියම් බාහිර මූලාශ්‍රයකින් රැස් කරගත් සියලු වේලාවන් හැර, **සූර්යයාගේ දීප්තිමත් තැටියේ යම් කොටසක් දෘශ්‍යමාන වන සෑම අවස්ථාවක දීම සූර්යයා දෙස බැලිය යුත්තේ සූර්ය දර්ශකය භාවිතයෙනි.**

5) අවබෝධ කරගැනීමට පහසු වන අයුරෙන් මෙම උපදෙස් මාලාව සමඟ ග්‍රාපිකරූපී පැහැදුම් අතිරේක අමුණා ඇත.

---

**ඔබ පහත සඳහන් ප්‍රකාශයන් කියවා, තේරුම්ගෙන, ඒවාට අනුකූල විය යුතුය:**

## සූර්ය දර්ශකය ප්‍රවේසමෙන් භාවිත කිරීමට නම්, මම එහි භාවිතය පිළිබඳ සියළුමඋපදෙස්අනුගමනයකළයුතුයි.

## හිරුගේ දීප්තිමත් තැටියේ යම් කොටසක් දිස්වේ නම්, හිරුදෙසබලනවිට මම සූර්ය දර්ශකය භාවිත කළ යුතුයි.

© 2014-2024

## ** මගේ පිහිටීමේදී ග්‍රහණය පූර්ණනොවේ **

ඔබ පූර්ණ ග්‍රහණයේ ගමන්මගෙහි නොසිටිනා අතර, එහෙයින් පූර්ණ සූර්යග්‍රහණයේ සුන්දරත්වය අත් නොවිඳිනු ඇත. (ඔබවිසින් මෙමවිශිෂ්ටඅත්දැකීමලබාගැනීමට නම්, පූර්ණ ග්‍රහණයේ ගමන්මගෙහි ස්ථානගත වන මෙන් අප දැඩි ලෙස නිර්දේශ කරමු!)

1) ඔබගේ නිශ්චිත පිහිටීම සඳහා eclipse2024.org/find-times විසින් සපයා ඇති තොරතුරු මත පදනම් ව, පහත ලැයිස්තු ගත කර ඇති එක් එක් ග්‍රහණ සිද්ධීන් වලට අදාළ දළ වේලාවන්සටහන් කර තබාගන්න (ඔබගේ වේලා කලාපය අනුව වේලාව වෙනස් කරගැනීමට ද වග බලාගන්න!):

| | | | | | |
|---|---|---|---|---|---|
| **C1 ට පෙර** | * කිසිඳු ග්‍රහණයක් නොමැත * | |  |  | ඔබ සූර්ය දර්ශකය භාවිත කළ **යුතුයි** |
| **C1** | **අර්ධ ග්‍රහණය ඇරඹෙන්නේ:** | |  |  | ඔබ සූර්ය දර්ශකය භාවිත කළ **යුතුයි** |
| **මධ්‍ය-ග්‍රහණය** | **සිදුවන්නේ:** | |  |  | ඔබ සූර්ය දර්ශකය භාවිත කළ **යුතුයි** |
| **C4** | **අර්ධ ග්‍රහණය නිමා වන්නේ:** | |  |  | ඔබ සූර්ය දර්ශකය භාවිත කළ **යුතුයි** |
| **C4 ට පසු** | * කිසිඳු ග්‍රහණයක් නොමැත * | |  |  | ඔබ සූර්ය දර්ශකය භාවිත කළ **යුතුයි** |

(ඔබේ පිහිටීමේ දී සූර්යග්‍රහණය පූර්ණ නොවන බැවින්, C2 හා C3 වේලාවන් කිසිවක් ලැයිස්තුගත කර නොමැති බව සලකන්න!)

2) **ඔබ සිටින තැනදී සූර්යග්‍රහණය පූර්ණ නොවන බැවින්, ඔබ විසින් සෑම විටම සූර්යයා නිරීක්ෂණය කිරීම සඳහා සූර්ය දර්ශකය යොදා ගත යුතුයි.** නැවත කියතොත්, පූර්ණ ග්‍රහණයේ ගමන්මග තුලට පිවිසෙන ලෙසට අප ඔබට නිර්දේශ කරමු. ඔබත් සමඟ සූර්ය දර්ශකය රැගෙන යාමට අමතක නොකරන්න, එමඟින් ඔබට සූර්ය ග්‍රහණයේ අර්ධ අදියරයන් ආරක්ෂිතව නිරීක්ෂණය කළ හැකියි!

3) අවබෝධකරගැනීමටපහසුවනඅයුරෙන්මෙමඋපදෙස්මාලාව සමඟග්‍රාපිකරූපීපැහැදුම්අතිරේකඅමුණා ඇත.

---

**ඔබ පහත සඳහන් ප්‍රකාශයන් කියවා, තේරුම්ගෙන, ඒවාට අනුකූල විය යුතුය:**

**සූර්ය දර්ශකය ප්‍රවේසමෙන් භාවිත කිරීමට නම්, මම එහි භාවිතය පිළිබඳ සියළුමඋපදෙස්අනුගමනයකළයුතුයි.**

**හිරුදෙසබලනසෑම විටම මම සූර්ය දර්ශකය භාවිත කළ යුතුයි.**

© 2014-2024
Eclipse2024.org

PDF

සිංහල

GRAN ECLIPSE NORTEAMERICANO

GRANDE ÉCLIPSE NORD-AMÉRICAINE

GREAT NORTH AMERICAN ECLIPSE

ECLIPSE 2024 .org